


## පොලිසිය ඇත්තේ අපේ අතේයා

කෙහෙල් කැනක් කැපු එකා දඬේ කයි
අපේ එවුන් කෝට්යට වැඩේ දෙයි
ඇද්දොත් එය පොලිසියට ලෙඩේ එයි
ඒ. ඇස්. පී. ලත් අපට කඩේ යයි

අපේ එකෙක් නම් පොලිසියෙ කොස්සා
තරුපටි පළඳම් ඉහළට උස්සා
සුදුස්සාව බිංදුවටම බස්සා
ආකාසෙට නග්ගම් නුසුදුස්සා

මගෙ වැඩ හරහට දැම්මොත් යෂ්ටිය
යන්නට වෙයි ඇතුළට මිනි පෙට්ටිය
මට නැතුවම බැහැ පොලිසියෙ කට්ටිය
ඒ අයටත් දෙන්නෙම් මම කුට්ටිය

දුබලයො දුටු තැන අතපය පිම්බුව
ඕ. අයි. සී. නම් පිත්තල සෙම්බුව
බල්ලට දා ඇත පොලිසියෙ නම්බුව
කන්නද බං ඔය නම්බුවෙ කොම්බුව ?

විරෝධතා පෙළපාලි කොලොප් පන්
නවතයි පොළිසියෙ අඬුපඬු පුප් පන්
ටිකක් මටත් එයි මුදලින් කප් පන්
හවසට පින්තක පින්තක පම් පම්!

සැඟවුණ ආයුධ සෙවුමට දස්සයි
බඩු පෙන්නන කොට කොකාව ගස්සයි
බෙල්ලෙන් අල්ලා පී. සී. එස්.අයි
ජුලම්පිටියෙ ඇවිදින් දණ ගස්සයි

වරෙන්තු සීයක් අමරෙට ඇත්තේ
නැහැ ඒ පල්බොරු විරුද්ද පැත්තේ
පහකට වැඩි නැති බව කිව යුත්තේ
ඒකයි පොලිසිය ඇල්ලුවෙ නැත්තේ

ළමයින් ඉස්කෝලෙට ඇර ලනවා
මැඩම්ව මාකට් කැඳවන් යනවා
එළවළු මස්ටික අරගෙන එනවා
පී. සී. මගෙ බල්ලත් නා වනවා

අතවැසියෙකි මගෙ පොලිස්යෙ ලොක්කා
මා ළඟ කැරකෙයි ලෙස බලු කුක්කා
නොසේදුවොත් මිනිහා මගෙ කක්කා
දැඩුවම් දෙමි යාපනයට දක්කා

දම්සක් සළකුණ
දෙවුර මතේයා
වැඩකිඩ අන්තිම
කැතම කැතේයා
පොලිසිය ඇත්තේ
අපේ අතේයා
මුන් ටික නැත්තං
අපිත් නැතේයා!



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

# සෞදියේ රැකියාවට යන ලාංකිකයින්ගේ ඉරණම

## තම ආගම ඇදහීමට එහේ නිදහසක් නෑ

**සෞදි** අාරාබියාවේ රැකියාවල නියුතු ශ්‍රීලාංකික ශ්‍රමිකයන්ට තමන්ගේ ආගම ඇදහීමටවත් නිදහසක් නැති බව එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී රන්ජන් රාමනායක මහතා පවසයි.

පසුගිය දා ශ්‍රීලාංකිකයකු බුද්ධ ප්‍රතිමාවකට වදිමින් සිටියදී සෞදි පොලීසිය ඔහු අමානුෂික ලෙස අත්අඩංගුවට ගෙන හිරිහැර කර ඇති බව පවසමින් රන්ජන් රාමනායක මහතා වැඩිදුරටත් මෙසේ කීය.

"පසුගිය මාසයේ දිනක සෞදි අරාබියාවේ රැකියාවේ නියුතු ප්‍රේමනාත් තුංගසිරි නමැති අය එහි ඔහු නැවතී සිටින ස්ථානයේ තබාගෙන සිටින කුඩා බුදු පිළිමයකට වදිමින් සිටියදී පොලිසීය ඔහු අත් අඩංගුවට ගෙන තිබෙනවා. ඒ රටේ බලපවත්වන ශාරියා නීතියට අනුව මුස්ලිම් ආගම හැර වෙන කිසිදු ආගමකට ඒ රටේ අවසර නැහැ. වෙනත් ආගමක් ඇදහීම එහි සලකන්නේ බරපතල වරදක් හැටියටයි. බත්තරමුල්ලේ තිබෙන විදේශ සේවා නියුක්ති කාර්යාංශයට මේ ගැන පැමිණිලි කළත් මේ වනතුරු කිසිදු පියවරක් අරගෙන නැහැ. දැනට අත් අඩංගුවේ පසුවන ඔහුගේ ජීවිතය කොයි මොහොතේ හෝ විනාශකර දැමීමට ඉඩ තිබෙනවා."

"අපේ රටට විදේශ විනිමය උපයලා දෙන මේ අපේ අහිංසකයින්ට තමන්ගෙ ආගමෙ අදහන්නට වත් නිදහසක් නැතිවීම හරි කණගාටුවක්. ඊටත් වඩා කණගාටු දායක තත්වය තමයි අපේ වගකිව යුතු අය මේ ගැන කිසිම පියවරක් ගන්නේ නැතිව අන්ධයන් බීරන් වගේ ඔහේ කිසි ගණනක් නැතිව ඉන්න එක."

සෞදියේදී වූ තවත් සිද්ධියක් ද මෙහිදී ඔහු පෙන්නුම් කළේය.

මේ නොබෝදා සෞදි අරාබියේ දීම එහි සුපිරි වෙළඳසැලකදී කුඩා දරුවෙකු දෙස බලා කීපවතාවක් සිනාසුණාය කියා අතේ කලුපාට නූලක් ගැටගසා ගෙන සිටි ලාංකික කාන්තාවක් අත් අඩංගුවට ගෙන ඇත. ඒ ඇය සූනියම් කරන කෙනෙක් බවට ඔවුන් සැකකර ඇති නිසාය. සිර බාරයට ගත් ඇයට කුමක්වීදැයි තවම තොරතුරක් නැත.

ශාරියා නීතිය යටතේ සෞදි අරාබියේදී අත්අඩංගුවට කෙනෙකු පත්විය හැකි කාරණා අපේ රටේ විදේශ සේවා කාර්යාංශය මැද පෙරදිගට යවන ශ්‍රමිකයන් දැනුම් වත් නොකිරීම නිසා එහිදී නොයෙක් හිරිහැර විඳින අපේ ශ්‍රමිකයන්ගේ ගණන විශාලය. කුමන මොහොතක හෝ මේ අහිංසක ශ්‍රමිකයන්ගේ ගෙළ කපා මරාදැමීමට තීරණය කිරීමට ඉඩ ඇත.

අප රටින් පිටරට රැකියාවලට යන අයගෙන් වැඩි පිරිසක් බෞද්ධයන්ය. නොයෙක් වතාවලදී ඔවුන් සේවයකරන නිවෙස්වල හිම්පුතුන් සේවයට පැමිණි කාන්තාවන්ට කරන ඉල්ලීම් වලට අකමැති වුවහොත් විවිධ කරදර වධහිංසා පමුණුවන බව නොයෙක් විට වාර්තා වෙනවා. එපමණක් නොව අපේ බෞද්ධ ශ්‍රමිකයන් බලහත්කාරයෙන් ඉස්ලාම් ආගමට බඳවාගන්නා බවටද අනන්තවත් අහන්නට ලැබෙනවා. මීට ඉහත සෞදියේදී ලාංකික පිරිමින් හතරදෙනෙකු ගෙලකපා මරණයට පත්කිරීමට තීන්දු කළ අතර එහිදී ඔවුන් හතරදෙනා මුස්ලිම් ආගමට ගෙන මුස්ලිම් නම්ද යොදා අවසානයේදී ගෙලකපා මරාදැම්මා. තවද අගේ ගැහැණු ශ්‍රමිකයින් ශාරියා නීතිය යටතේ මුස්ලිම් ඇඳුම් වලින් සැරසීමටත් මොට්ටැක්කිළිය පළඳන්නටත් බලකරන බවට තොරතුරු ලැබෙනවා. මෙම තත්වය මත වර්තමාන රජය මෙම අහිංසකයින් ගැන කිසිම තැකීමක් නොකිරීම කණගාටු දායක තත්වයක්.

**(28. 06. 12 දිවයින පුවත්පතේ පළවූ ලිපියකිනි)**



# අම්මා (112) සහ දුව (80) ඉතා අසරණ තත්වයක

**ම**වට වයස අවුරුදු 112 කි. ඇය බලාගන්නා දියණියට 80 කි. මාතර මාලිම්බඩ හොරගොඩ පදිංචි මේ දෙදෙන අද ඉතා අසරණ තත්වයක සිටිති. මවගේ නම හේවාබල අමුණගේ පිංහාමිය. වැඩිමහල් දුව හේවාබල අමුණගේ ඇල්පිනාය. පවුලේ තවත් හතරදෙදෙනෙකු ඇතත් මව බලා ගන්නේ ඇයයි. අනෙක් අය සිටින්නේ ඈතය. පුතුන් තිදෙනගෙන් එක් අයෙක් මියගොසිනි. වයස්ගත මව හා දියණියට ජීවිකාවක් කරගත නොහැක. කාගේ හෝ පිළිසරණක් අවශ්‍යය. ගමේ අය ඔවුන්ගේ වියදමින් නාන්නට වතුර පයිප්පයක් ගේ අසල සවිකර දී ඇත. නමුත් එයට යන්නට ගොස් මග වැටී මව දැන් ඔත්පලව සිටී.

♦ ටී. කේ. සුගතදාස (මාලිම්බඩ වාර්තාකරු) (Island News)



**ඉරිදා - SUN** අපේ ලංකාවෙ මෝස්තර පැෂන්වලින් අඩුවක් නෑ. පැරිස් නිව්යෝක් වගේ තමයි. ඊටත් එහාට යනවා. මේවයෙදි තරුණ මැදිවයස මහලු කියලා වෙනසක් නෑ. හැමෝම ඉන්නෙ උන්මාදෙන්. කෑම ඇඳුම් ගමන් බිමන් යාන වාහන කතා බහ මේ සේරම දැන් එහේ අමුතුයි. තලවකැලේ නැන්දම්මා කියන්නෙ මේ සේරටම හේතුව "මේ මගුල් ටෙලිවිෂන්එකයි සෙල්ටෙල් එකයි ආපු හන්ද" කියලා. "ඒ කාලෙ රේඩියෝ වැරලස් තියෙද්දි ඔය කිසි විස්වුර්ණයක් අපේ සමාජෙට ගෑවිලාවත් තිබුණෙ නෑ දුවේ....අපි කොච්චර සැහැල්ලුවෙන්ද හිටියෙ...? දැන් මේ ලොකු කෙල්ල ගන්නදෙයක් නෑ උදේ ඉඳලා හැන්ද වෙන කල් අර මොකක්ද මගුලක් කනේ ගහගෙන ඉන්නවා, කටුස්සා වගේ ඔලුව වන වන. ඉගනගන්න පාටක් නම් පේන්නෙ නෑ" නැන්දම්මා ඒ විස්සෝපෙන් වගේ කිව්වේ එයාගෙ මිනිපිරී ගැන. ලොකු දුව ශ්‍රියානිගෙ ළමයෙක් ගැන. මම මුකුත් කියන්න ගියේ නෑ. අහගෙන හිටියා.

**සඳුදා - MON** අපි ඊයෙ ගියා විම්බෙල්ඩන් ටෙනිස් ෆයිනල්ස් බලන්න. නිහාල් එයාගෙ බොස්ට නහයෙන් අඬලා ලාබ ටිකට් තුනක් අරන් ඇවිත් තිබුණා. මටයි පොඩි දුවටයි එක්ක. පුතා සති අන්තෙ එයාගෙ ඉස්කෝලෙ ගණනෙ පැරිස්වලට කෝච් ට්‍රිප් එකක් ගිහිං. අපි කවුරුත් කැමති වුණේ ඇන්ඩි මරේ දිනනවට තමයි. ඒත් මගදි එතනහිටි කාටත් තේරුණා මරේට ෆෙඩරර් එක්ක මේ ආත්මෙ දිනන්න බැරි බව. මරේ අවසාන තරඟයට තේරිච්ච එක ලොකු දෙයක් අවුරුදු 73 කට පස්සෙ. ඒ වුණාට ටෙනිස් ෆයිනල්ස් දිනන්න පුළුවන් සුද්දෙක් හෝ කවුරු හෝ බ්‍රිතාන්‍යයෙක් තවම ඉපදිලා නැහැ කියලා මට හිතුණා. ෆෙඩරර්ගෙ ජයග්‍රහණය වටිනවා. එයා තමයි එදා ඉරිදා ඒ කප් එකට නියම සුදුස්සා!

**කුජදා - TUE** ලංකාවෙ කෙරෙන හුඟක් වැඩ ඔහේ කරනවා මිසක තේරුමක් ඇතුව කරන දේවල් නොවෙන බව පේනවා. හරිපාරෙ ටිකක් දුර ගිහිං පීලි පනිනවා. පණ්ඩිතයො අඩ්වයිසර්ලා හරියට. ඒ අය නොදන්න දෙයක් නැහැ. ඒත් අන්තිමට වැඩේ කෙරිලා නෑ. අරයා මෙයාට දොස් කියනවා. මෙයා එයාට දොස් කියනවා. ක්‍රිකට් ක්‍රීඩාව ගත්තත් ඩෙංගු මර්දනය ගත්තත් ඒ බව අපට පේනවා. ඩෙංගු කරදරේ දැන් අවුරුදු හතක අටක විතර කාලයක ඉඳලා තියෙන්නෙ. දැනට විශාල ගණනක් මැරිලා තියනවා. මැලේරියාවෙන් අපේ රටේ මිනිස්සු නමසිය තිස් හතළිස් ගණන් යුගයෙ මැරුණා බෙහෙත් නැති නිසා. ඒත් මේ දැන් හැමදේම තියන කාලෙ ලංකාවට හොඳම ෆෙරාරි පෝෂ්කාර් ගෙන්නන කාලෙ ඩෙංගු මදුරුවට ගහන්න හරි බෙහෙතක් ගේන්න අපේ ආණ්ඩුවෙ ඉන්න පණ්ඩිතයන්ට බැරිවුණා. අපේ රටට සෞඛ්‍ය ඇමතිකෙනෙක් ඇත්තටම මොකටද? වැඩක් නෑ....

**බුදදා - WED** අලුත්ම ආරංචිය නුවර කුණ්ඩසාලේ හදන්න යන ගුවන්තොටුපල. කුණ්ඩසාලෙ තිබුණේ අපේ හොඳම ගොවිපල. දැන් ඒක විනාස කරලා ඒ හරියෙ එයාර්පෝට් එකක් හදන්න යනවා. මට දැන් මතක් වෙනවා මැරුණු ප්‍රේමදාස ජනාධිපතිවරයා ගම් උදාව සංකල්පය හදලා උන්නැහෙ කිව්වා ගෙවල් ලක්ෂයක් හදන බව. 'හැම කෙනෙකුගෙම හිසට වහලක්' කියලා පාඨයක් දාලා ඒ කාලෙ හැම තැනම පෝස්ටර් ගැහුවා. ඒ වගේ දැන් මේ රජයේ මැති ඇමතිවරු ජනතාවට දෙන්න යන ඡන්ද පොරොන්දුව තමයි "හැම ගමකටම එයාපෝට් එකක්." ඒකෙන් ගමේ අයගෙ ගමන්බිමන් පහසුවෙනවා. එතකොට ප්‍රයිවට් බස්කාරයින්ට බම්බුගහගන්න කියලා ගමේ ජනතාව බඩුගේන්න ප්ලේන්එකෙන් ඉරිදාපොළට යාවි. ළමයි ඉස්කෝලෙ යාවි එකෙන්. මරු නේ. රට නිකම්ම දියුණු වෙනවා. ආසියාවෙ නෙවෙයි ලංකාව මුලු ලෝකෙම මහා ආශ්චර්යය වෙනවා. අපෝ ඇමරිකන් කාරයොයි බ්‍රිටිෂ් අයයි එතකොට අපි ගැන ඉරිසියාවෙන් පැලිලා මැරේවි.

**ගුරුදා - THU** මේ දවස්වල ලංකාවෙ යන ලොකුම හා හෝව තමයි මැරුණු උපාලි විජේවර්ධන මහත්තෙයා දැන් දකුණු ඇමරිකාවෙ මෙක්සිකෝ වල ඉන්නවයි කියලා. බැලින්නම් එදා ගුවන් අනතුරෙන් එයා මැරිලා නැහැ. ඒ ආරංචිය ආවෙ සිංහළ වෙබ් අඩවියක. මේ ආරංචිය දැන් හැම තැනම ගිහිල්ලා. ජාඇල කැතරින් කුඩම්මා මට අද උදේ තකහනියක් පෝන් කළා මේ විත්තිය කියන්න. මම කිව්වා මම වෙබ් එකේ දැක්කය කියලා. දැන් ආරංචිය උපාලි එහෙන් ලන්ඩන්වලට ඇවිත් කියලා. පොඩ්ඩක් හොයලා බලන්නය කිව්වා. මං කිව්වා කුඩම්මෙ එයා මට මූණට හම්බවුනත් අඳුරන්න බෑ. මොකද මම උපාලි විජේවර්ධන කවදාවත් පණපිටින් දැකලා නැති නිසා කියලා.

**කිව්දා - FRI** ශාන්ත අද ආවා එයා පවුම් 620 කට ලන්ඩන් ඔලිම්පික් තරඟ ආරම්භය බලන්න ගත්තු ටිකට් එක අපිට පෙන්නන්න. කලින් අපි පල් එක දැම්මා බොරුවක්ය කියලා. බොරුවක් නෙවෙයි ඇත්ත. ඒ ගණන සම්පූර්ණ තරඟ මාලාවම බලන්නත් නෙවෙයි. තරඟ තුනක් විතරයි. "ඒත් ඒක වටිනවා. ඒ ගණනට මට ලංකාවට ගිහිං එන්න තිබුණා. ඒක වෙනදෙයක්. එහෙම ලෝබ වුනානම් ඉතින් ඇමරිකන්කාරයා හඳට යන්නෙත් නෑ" ශාන්ත කිව්වා.